# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2255 / 54 - 2021 නොවැම්බර් මස 26 වැනි සිකුරාදා - 2021.11.26

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස : (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

06 වන සංශෝධනය

**රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණ සේවා ව්‍යවස්ථාව**

පහත I කොටසෙහි සඳහන් පරිදි සංශෝධිත 2013 ජුනි මස 26 වැනි දිනැති අංක 1816/12 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණ සේවා ව්‍යවස්ථා සංග්‍රහය පහත II කොටසෙහි දැක්වෙන ආකාරයට නැවත සංශෝධනය කරනු ලැබේ. එහි සඳහන් අනෙකුත් කරුණු හා කොන්දේසි නොවෙනස්ව පවතී.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියෝගය පරිදි ,

**එම්.ඒ.බී.දයා සෙනරත්,**
ලේකම්,
රාජ්‍ය සේවා කොමිෂන් සභාව.

2021 නොවැම්බර් මස 26 වැනි දින.


1A - G 35445 - 15 (2021/11)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

**I කොටස**

| | |
|---|---|
| සංශෝධන අංක 01 | - 2014 දෙසැම්බර් මස 12 වැනි දින හා අංක 1892/40 *අති විශෙෂ ගැසට් පත්‍රය* |
| සංශෝධන අංක 02 | - 2014 දෙසැම්බර් මස 19 වැනි දින හා අංක 1893/39 *අති විශෙෂ ගැසට් පත්‍රය* |
| සංශෝධන අංක 03 | - 2016 අගෝස්තු මස 23 වැනි දින හා අංක 1981/43 *අති විශෙෂ ගැසට් පත්‍රය* |
| සංශෝධන අංක 04 | - 2019 පෙබරවාරි මස 18 වැනි දින හා අංක 2111/4 *අති විශෙෂ ගැසට් පත්‍රය* |
| සංශෝධන අංක 05 | - 2021 අගෝස්තු මස 06 වැනි දින හා අංක 2239/54 *අති විශෙෂ ගැසට් පත්‍රය* |

**II කොටස**

**පළමුවැනි පරිශිෂ්ඨය**

පළමුවැනි පරිශිෂ්ඨයේ අනු අංක 2.2 (i),(ii), (iii) යටතේ සඳහන් සියලුම කරුණු වෙනුවට පහත සඳහන් කරුණු ඇතුළත් කරනු ලැබේ.

2.2 අභ්‍යන්තර අයදුම්කරුවන් සීමිත තරඟ විභාගයකින් සහ සුදුසුකම් පරීක්ෂා කිරීමේ සම්මුඛ පරීක්ෂණයක් මගින් බඳවා ගැනීම සඳහා සුදුසුකම් :

2.2.1 සහකාර රජයේ මුද්‍රණාලයාධිපති (නිෂ්පාදන) , සහකාර රජයේ මුද්‍රණාලයාධිපති (නඩත්තු) හා සහකාර රජයේ මුද්‍රණාලයාධිපති (මුද්‍රණ සංස්කාරක) තනතුරු සඳහා :

(*අ*) මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දෙපාර්තමේන්තුගත තනතුරක (කළමනාකරණ සහකාර තාක්ෂණ සේවා ගණයේ) වසර 15 ක නොඅඩු සේවා කාලයක් සහිත මුද්‍රණ සේවයේ අධීක්ෂණ කළමනාකරණ සහකාර (තාක්ෂණ) සේවා ගණයේ නිලධාරියකු වීම;

(*ආ*) ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනයේ හෝ පිළිගත් ආයතනයක මුද්‍රණ ශිල්පය පිළිබඳව පාඨමාලා 02 ක් හදාරා සහතික ලබා තිබීම; (පාඨමාලාවක කාල සීමාව වසරකට නොඅඩු විය යුතුයි)

(*ඇ*) රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අංක 01/2020 හා ඊට අනුෂාංගික චක්‍රලේඛවල සඳහන් විධිවිධානයන්ට අනුකූලව විනයානුකූල දඬුවමක් ලබා නොතිබීම.

12– 217

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.